# ප්‍රසම්පාදන දැන්වීම

## ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය

### 165kW ජාලගත ශුද්ධ ගිණුම්කරණ ක්‍රමවේදය යටතේ (Net Accounting Scheme) සූර්ය බල පද්ධතියක් සැපයීම

**ප්‍රසම්පාදන අංකය: SLITA/SOLAR/01/2024**

1. ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ජාලගත ශුද්ධ ගිණුම්කරණ ක්‍රමවේදය **(Net Accounting Scheme)** යටතේ සූර්ය බල පද්ධතියක් සැලසුම් කර ප්‍රවාහනය කර සපයා, ස්ථාන ගත කර, ක්‍රියාත්මක කර, නඩත්තුව සමඟින් පවත්වා ගෙන යාමට මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

2. සියලුම ලංසුකරුවන් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ලියාපදිංචිය සහිත වසර 05ට වඩා සූර්ය බල පද්ධති සැලසුම් කිරීම, සැපයීම, ස්ථාන ගත කිරීම සහ පද්ධතිය ක්‍රියාත්මක කර, නඩත්තුව සමඟින් පවත්වා ගෙන යාම පිළිබඳව පළපුරුදු ආයතන විය යුතුය.

3. ලංසුකරනය ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රියාපටිපාටිය යටතේ සිදු කරනු ලැබේ.

4. සතියේ වැඩ කරන දිනවල (පෙ.ව. 9.00- ප.ව.3.00) තුල පැමිණ ලංසු ලේඛන පරීක්ෂා කිරීමට හැකියාව ඇත.

5. සියලුම ලංසුකරුවන් 202**4**.02.08 දින සිට 202**4**.06.28 දින දක්වා වලංගු වන ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කළ , ශ්‍රී ලංකාවේ පිළිගත් වාණිජ බැංකු විසින් නිකුත් කරන ලද , කොන්දේසි රහිත , වහාම මුදල් ලබා ගත හැකි රු. 310,000/- ක් වටිනා ලංසු රක්ෂණයක් "අධ්‍යක්ෂ ජනරාල් " නමට ඉදිරිපත් කළ යුතුය.

6. අභිලාෂී ලංසුකරුවන්ට මුදලින් ආපසු නොගෙවන ලද රු.7,500/- ක ගාස්තුවක් ගිණුම් අංශය වෙත මුදලින් ගෙවා ඉංග්‍රීසි මාධ්‍යයෙන් මුද්‍රිත සම්පූර්ණ ලංසු කට්ටලයක්, ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇගලුම් ආයතනය, අංක 02, කඳවල වත්ත, රත්මලාන යන ලිපිනයට ව්‍යාපාර ලිපි ශිර්ෂයක ලියන ලද ඉල්ලුම්පතක් ඉදිරිපත් කිරීමෙන් 2024.02.08 දින සිට 2024.02.27 දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා වූ කාලය තුළ ලබා ගත හැක.

7. මුද්‍රා තැබූ ලංසු අනුපිටපතකින් යුතුව 2024.02.28 දින ප.ව. 2.00ට හෝ ඉන් පෙර ලැබෙන සේ ඉදිරිපත් කල යුතු අතර "ලංසු ලේඛණය" ලිපි කවරයක බහා එම ලිපි කවරයේ ඉහළ වම් කෙළෙවරේ "ප්‍රසම්පාදන අංකය හා ජාල ගත ශුද්ධ ගිණුම් කරණ සූර්ය බල පද්ධති" යන්න සඳහන් කර අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය, රත්මලාන යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ආයතනයේ පරිපාලන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම සිදු කල යුතුය.

8. ලංසු, ලංසු භාර ගැනීමේ දින සිට දින 2024.07.28 ක් දක්වා වලංගු විය යුතුය.

9. පූර්ව ලංසු රැස්වීම 2024.02.14 දින ප.ව. 3.00ට අංක 02, කඳවල වත්ත, රත්මලාන, ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනයේ රැස්වීම් ශාලාවේදී පැවැත්වේ.

10. 2024.02.28 වන දින ප.ව. 2.00ට ලංසු විවෘත කරනු ලබන අතර, ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයෙක්ට මෙම අවස්ථාවට සහභාගී විය හැක.

11. අසම්පූර්ණ හා ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලබන අතර, ලංසු භාර ගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය ප්‍රසම්පාදන කමිටුව සතුවේ.


**අධ්‍යක්ෂ ජනරාල්**

**ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇගලුම් ආයතනය**

**අංක 02, කඳවල වත්ත, සේනාධිපති ශ්‍රීමත් ජෝන් කොතලාවල පාර, රත්මලාන**

**දුරකථන අංක - 0112632406 වෙබ් -** www@slita.ac.lk